සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/08/01චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2024.07.22

## සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ- 2024/10

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමණාකරුවන්**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා විශේෂ මාසික දීමනාව හා දින වැටුප් ලබා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම</u>**

### 01. හැඳින්වීම.

අඩු ආදායම්ලාභීන් ඇතුළු සමස්ථ ගණුදෙනුකරුවන්ගේ තැන්පතු ,ණය ඇතුළු මූල්‍ය සේවා නොපිරිහෙලා ඉටුකර දීම, ක්ෂුද්‍ර මූල්‍ය වෙළඳපලේ කටයුතු කරන අනිකුත් මූල්‍ය ආයතන ඇති කරන තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීම හා ඉලක්ක ගත ජනතාව සවිබලගැන්විමට පහසුකම් සැලසිම වැනි කාර්යයන් බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩලය ඉටුකරමින් සිටී.

වර්තමානයේ පවතින ආර්ථික හා සමාජීය අර්බුදකාරි තත්වය තුළ, තැන්පත් රැස්කිරිම හා ණය මුදල් නිදහස් කිරීම හා ආපසු අයකර ගැනීමේදී මහත් වෙහෙසක් දැරීමට සිදු වී ඇත. එම අභියෝග ජයගනිමින්, සමෘද්ධි බැංකු මඟින් සපයන මූල්‍ය සේවා සැපයිම කාර්යක්ෂම සිදු කිරිමට බැංකු කාර්යය මණ්ඩලය කැපවීමෙන් හා උනන්දුවෙන් කටයුතු කරමින් සිටී.

ඒ සඳහා, බැංකු කාර්ය මණ්ඩල උනන්දුව ඇති කිරීම හා අභිප්‍රේරණය ඇති කිරීම සඳහා ඔවුන්ට මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභයන් ලබාදීමට අපේක්ෂා කර ඇත. ඒ සඳහා වූ, මඟපෙන්වීමට මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන බව දන්වනු කැමැත්තෙමි.
2024.06.03 දිනැති අංක 2024/130/02 දරන සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමණාකරන මණ්ඩලය ලබාදුන් උපදෙස් මත මෙම චක්‍රලේඛය නිකුත් කරන බවද දන්වමි.

02. මෙම චක්‍රලේඛය නිකුත් කිරිමත් සමඟ 2023.04.27 දින සකස් කරන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2023/5 , 2023.08.31 2023/05 ට පළමු එකතුව 2024.07.01 දින සිට අවලංගු කරන බවද දන්වමි.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

Tel- / Fax - / E-mail-

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General: 011-2872202, 011-2889002, dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment): 011-2873799, 011-2873996, diradmin@samurdhi.gov.lk, **Hot Line :0112-889007**

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant: 011-2869742, 011-2869742, finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance): 011-2889003, 011-2887469, **Hot Line:0112-885582**

කාර්යාලය / அலுவலகம் / Office: 0112872202, **Hot Line: 011- 2887722**


c:\users\user\downloads\documents\විශේෂ මාසික දීමනා හා දින වැටුප් ගෙවීම 2024.07.16.docx

## 03. මාසික විශේෂ දීමනාව

### 3.1 විශේෂ මාසික දීමනාව

| විස්තරය | විශේෂ දීමනාව (රු) (මාසිකව) |
|---|---|
| 1. <u>සමෘද්ධි ප්‍රජාමූල බැංකුව</u> | |
| කළමණාකරු | 7500.00 |
| සහකාර කළමණාකරු | 7000.00 |
| පොත් තබන්නා | 6000.00 |
| ගිණුම් ලිපිකරු - 1 | 6000.00 |
| ගිණුම් ලිපිකරු - 2 | 6000.00 |
| මුදල් අයකැමි | 6000.00 |
| 2. කලාප සහකාර (ක්ෂේත්‍ර) | 4000.00 |
| 3. <u>සමෘද්ධි ප්‍රජාමූල සමිතිය</u> | |
| කළමණාකරු | 5000.00 |
| සහකාර කළමණාකරු | 3500.00 |
| ව්‍යාපෘති කළමණාකරු | 3500.00 |
| අනෙකුත් කාර්ය මණ්ඩලය-ලිපිකරුවන්, ව්‍යාපෘති සහකාර, සමාජ සංවර්ධන නිළධාරි | එක් නිළධාරියකුට රු.2500/- බැගින් |
| 4. ක්ෂේත්‍ර ගත (ග්‍රාම නිළධාරි වසම් ) සේවය කරන සමෘද්ධි සංවර්ධන නිලධාරින් | එක් නිළධාරියකුට රු.2500/- බැගින් |

3.2 දැනට සමෘද්ධි බැංකු හා බැංකු සමිති සඳහා අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරින්ට (Development Officers) මෙම දීමනාව අදාල නොවේ.නමුත් නිත්‍ය කාර්ය මණ්ඩල සාමාජියකුගේ පුරප්පාඩුවක් වෙනුවෙන් සංවර්ධන නිලධාරියකු වැඩබැලීමට /රාජකාරී ආවරනයට පත්කර ඇතිවිටක නිත්‍ය සාමාජිකයාට හිමි දීමනාව මෙම නිළධාරියාට හිමි වේ.

3.3 යම් නිළධාරියකු නිත්‍ය තනතුරුට අමතරව යම් තනතුරුක වැඩබලන විටක, අදාල සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් ඔහු/ඇයට දීමනාව ලබාදිය යුතුය. නමුත් එකවර තනතුරු 01 වඩා වැඩබලන විටක එක් වැඩබලන තනතුරුවකට පමනක් මාසික දීමනා ගෙවීමට ඉඩදෙනු ලැබේ.

3.4 යම් නිළධාරියකුට මෙම මාසික දීමනාව ලැබීමට නම් ,අවම මාසයක කාලයක් අදාල සේවා ස්ථානයේ සේවය කර තිබිය යුතුවේ.

3.5 යම් නිළධාරියෙකු සම්බන්ධව මූලික පරීක්ෂණයක්/ විනය පරීක්ෂණයක් සිදුකරන විටක ඔහු/ඇයට මාසික දීමනා ලබා ගැනීමට සුදුසුකම් නොලබන අතර, ඉදිරි දිනක චෝදනාවලින් නිදහස් වූ විටක දීමනා ලබාදීම සලකා බැලිය හැක.

## 4. සමෘද්ධි ප්‍රජාමූල බැංකු/බැංකු සමිති මාසික විශේෂ දීමනාව ලබා ගැනීම

### 4.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකුව මාසික විශේෂ දීමනාව ලබා ගැනීම

පහත නිර්ණායක හා කොන්දේසි සියල්ලම (100%) දීමනාව ලබාගන්නා මාසයේ අවසානයේ (වැඩ කරන අවසාන දිනට) සම්පූර්ණ වී තිබිය යුතුය.

i. ආසන්න (පසුගිය වර්ෂය) පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් ලාභයක් උපයා තිබීම.

ii. ඉතුරුම් තැන්පතු(සාමාජික තැන්පතු ,අනිවාර්ය ඉතිරි කිරිම් තැන්පතු හා ස්ථාවර තැන්පතු ගිණුම් හැර) වල තැන්පතු මුදලෙහි වර්ධනයක් ලබාගෙන තිබීම. (වර්ෂයේ ජනවාරි 01 දිනට සාපේක්ෂව)
ගනනය කරන දිනට, අදාල බැංකුව හි සලකා බලන ගිණුම් වල මුළු තැන්පතු මුදලට සාපේක්ෂව පහත වගුවේ දැක්වෙන වර්ධනයක් ලබාගෙන තිබීම.

| තැන්පතු මුදල් වල සමුච්චිත එකතුව (රු) (සෑම වර්ෂයකම ජන.01 දිනට) | අවම තැන්පතු වර්ධනය (%) (සලකා බලන මාසය තුල) | වර්ධනය ගණනය කරන ආකාරය |
|---|---|---|
| මිලියන 25 හෝ ඊට අඩු | 1% | සලකා දිනට බලන මුළු තැන්පතු මුදල (රු) – 20........01.01 දිනට මුළු තැන්පතු මුදල(රු.)<br>―――――――――― X 100<br>20........01.01 දිනට මුළු තැන්පතු මුදල(රු) |
| මිලි. 25 ට වැඩි මිලි.50 හෝ ඊට අඩු | 0.5% | |
| රු මිලි.50 ට වැඩි | 0.1% | |

උදා: **1.** රුවන්පුර බැංකුවේ (සාමාජික තැන්පතු ,අනිවාර්ය ඉතිරි කිරිම් තැන්පතු හා ස්ථාවර තැන්පතු හැර) 2024.7.31 දින මුළු තැන්පතු මුදල රු.මිලි.24 ක් ලෙස උපකල්පනය කලවිට,ජුලි මස දීමනාව ලබා ගැනීමට තැන්පතු වර්ධනය 1% ක් තිබිය යුතුය.

**2.** 2024.01.01 දිනට මුළු තැන්පතු මුදල රු.මිලි. 22 ක් වේ.

**2024.**07.31 දිනය තැන්පතු වර්ධනය $= \frac{24 - 22}{22} * 100 = 9\%$

iii. ණය තැන්පතු අනුපාතය 60% ක් හෝ ඊට වැඩි විය යුතුය. (අනිවාර්ය ඉතිරි තැන්පතු හැර)

iv. බොල්ණය අනුපාතය 7%ක් හා කල්පසුවූ ණය අනුපාතය 10% හෝ ඊට අඩුවිය යුතුය.

මෙම අනුපාතයන්, මෙම දීමනාව ලබාගැනීමට පමණක් අදාල වේ.

v. සෑම මාසයක් අවසන් වී එළඹෙන මාසයේ 05 දින හෝ ඊට පෙර, ණය ,තැන්පතු, ආයෝජන හා ශේෂ පරික්ෂණය (තුලනය වූ) පිළිබඳ ප්‍රගති වාර්තා සමෘද්ධි බැකු සමිතියට ලබා දී තිබිම.

vi. මාසය තුල ලද, අභ්‍යන්තර/භාහිර විගණන විමසුම් සදහා දින 14ක් තුළ පිළිගත හැකි පිළිතුරු ලබාදී තිබීම.

## 4.2 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සදහා මාසික විශේෂ දීමනාව ලබා ගැනීම

පහත නිර්ණායක හා කොන්දේසි සියල්ලම (100%) දීමනාව ලබාගන්නා මාසයේ අවසානයේ (වැඩ කරන අවසාන දිනට) සම්පූර්ණ වී තිබිය යුතුය.

i. ආසන්න (පසුගිය වර්ෂය) පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් ලාභයක් උපයා තිබීම.

ii. සමෘද්ධි ඉසුරු හා නව සමෘද්ධි ව්‍යවසායක සංවර්ධන ණය වැඩසටහන් යටතේ මුදාහල ණය මුදල් හි බොල් ණය අනුපාතය7% හා කල්පසු වූ ණය අනුපාතය 10%ක් හෝ ඊට අඩුවිය යුතුය.

iii. සෑම මාසයක් අවසන් වී එළඹෙන මාසයේ 10 දින හෝ ඊට පෙර, සමෘද්ධි බැංකු ණය ,තැන්පතු, ආයෝජන හා ශේෂ පරික්ෂණය (තුලනය වූ) පිළිබඳ ප්‍රගති වාර්තා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට ලබා දී තිබීම.

iv. සෑම මාසයක් අවසන් වී එළඹෙන මාසයේ 10 දින හෝ ඊට පෙර, සමෘද්ධි බැංකු සමිතියේ ණය තැන්පතු, අයෝජන හා ශේෂ පරික්ෂණය (තුලනය වූ) පිළිබඳ ප්‍රගති වාර්තා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට ලබා දී තිබීම.

v. මාසය තුල ලද, අභ්‍යන්තර/භාහිර විගණන විමසුම් සදහා දින 14ක් තුළ අදාල අංශය/අංශ වලට පිළිගත හැකි පිළිතුරු ලබාදී තිබීම.

vi. සමෘද්ධි බැංකු වලින් ආයෝජනය සදහා අරමුදල් ලැබී දින 03ක් ඇතුළත,( චෙක්පතක් නම් උපලබ්ධි වු දින සිට) දි ඇති උපදෙස් මත ආයෝජනය කර තිබීම.

vii. කල්පිරුණු ආයෝජන, බැංකුවේ ඉල්ලිම අනුව කටයුතු කර තිබීම හා පොළි නිවේදනය දින 05 (කල් පිරීම සිදුවීම)ක් තුල බැංකුව වෙත යොමුකර තිබිම.

4.3 මෙම චක්‍රලේඛ උපදෙස් මත සමෘද්ධි බැංකුවක්/බැංකු සමිතියක් නිර්ණායක/ කොන්දේසි සම්පූර්ණ කළ පසු, දීමනාවන් ලබා ගැනීම 2024.07.01 දින සිට ඉදිරියට අවස්ථාව ඇත.

**නමුත්, පහත ගැටළු පවතින අවස්ථාවක ,ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂගේ විශේෂ අනුමැතිය මත පමනක් දී ඇති උපදෙස් මත දිමනාව ලබාගැනිමට අවසරය ඇත.**

4.3.1. 2020.01.01 දිනෙන් පසුව පිහිට වූ නව බැංකුවක් අලාභදායි නම්, අලාභය නොසලකා හැර, අනෙකුත් කොන්දේසි සියල්ලම සම්පූර්ණ කරන විටක 2025.12.31 දින දක්වා අනුමත දීමනාවෙන් 60%ක් (ඒ ඒ නිළධාරියාට හිමි අනුමත දීමනාවෙන්) ලබා ගැනීම අවසර ඇත.

4.3.2.යම් බැංකුවක්, ලාභය හා තැන්පතු වර්ධනය,බොල් ණය අනුපාතය ,කල්පසු අනුපාතය යන කොන්දේසි අනිවාර්යයෙන් සම්පූර්ණ කර, අනෙකුත් කොන්දේසි 2024.07.31 සම්පූර්ණ නොවන විටක පමනක් 2024.07.01 දින සිට ඉදිරි මාස 06ක් වෙනුවෙන් අනුමත දීමනාවෙන්(ඒ ඒ නිළධාරියාට හිමි අනුමත දීමනාවෙන්) 50%ක් ලබාගැනීමට ඉඩ දෙනු ලැබේ. මෙම සහනය 2024.12.31 දක්වා පමණි.

4.3.3. සමෘද්ධි බැංකු සමිතියකට අයත් සමෘද්ධි බැංකු ගණන 01 හෝ 02 ඇති විටක, පසුගිය වර්ෂයේ අලාභයක් උපයාගෙන ඇත්නම්, අනුමත දීමනාවෙන් 50%ක් (ඒ ඒ නිළධාරියාට හිමි අනුමත දීමනාවෙන්) ලබා ගැනීමට 2025.12.31 දින දක්වා අවසර ඇත.

4.4.4 බලප්‍රදේශ සංශෝධනක දි, අළුතින් එකතු වූ වසම් වල තිබෙන බොල් ණය/කල්පසුවූ ණය හේතුවෙන් බොල්/කල්පසුවූ ණය අනුපාතය දී ඇති සීමාවන් ඉක්මවන්නේ නම්, පූර්ව අනුමැතියකින් පසුව 50% (ඒ ඒ නිළධාරියාට හිමි අනුමත දීමනාවෙන්)ක් 2025.03.31 දින දක්වා ලබාගැනීමට හැක.

4.4 ක්ෂේත්‍රගත (ග්‍රාම නිලධාරි වසම්වල) රාජකාරි නිරත සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට, පහත සියළු නිර්නායක/සුදුසුකම් සම්පූර්ණ කරන විටක, අනුමත මාසික දීමනාව 2024.07.01 දින සිට ලබා ගත හැකිය.

i. ග්‍රාම නිලධාරි වසමහි ණය තැන්පතු අනුපාතය 60% හෝ ඊට වැඩි විය යුතුය.
ii. ග්‍රාම නිලධාරි වසම්හි, බොල්ණය අනුපාතය7%ක්ද, කල්පසු වූ ණය අනුපාතය 10% ක් හෝ ඊට අඩුවිය යුතුය.
iii. කොටස් ඇතුළු අනෙකුත් ඉතුරුම් තැන්පතු( සමාජික තැන්පතු,ස්ථාවර තැන්පතු හා අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු හැර) වල තැන්පතු මුදලෙහි වර්ධනයක් ලබාගෙන තිබීම.
ඒ ඒ වසමේ පවතින තැන්පතු මුදලට අනුව,(සෑම වර්ෂයකම අවසාන දිනට සාපේක්ෂව) පහත වගුවේ දැක්වෙන පරිදි තැන්පතු මුදලෙහි වර්ධනයක්, කාලය තුල ලබාගෙන තිබීම.

| ග්‍රාම නිලධාරි වසමේ සමස්ථ තැන්පතු මුදල (සෑම වර්ෂයකම ජන.01 දිනට)) | අවම තැන්පතු වර්ධනය (%) (සලකා බලන මාසය තුල) | වර්ධනය ගණනය කරන ආකාරය |
|---|---|---|
| මිලියන 03 හෝ ඊට අඩු<br>මිලි. 03 ට වැඩි මිලි.5 හෝ ඊට අඩු<br>රු මිලි.5 ට වැඩි | 1%<br>0.5%<br>0.2% | සලකා දිනට බලන මුළු තැන්පතු මුදල (රු) – 20........01.01 දිනට මුළු තැන්පතු මුදල(රු.)<br>_______________ X 100<br>20........01.01 දිනට මුළු තැන්පතු මුදල(රු) |

මෙම වර්ධනය ගනනය කිරිමට ද,ඉහත බැංකුවට ලබා දී ඇති උදා; අනුවට වසමට ගලපා ගනනය සිදු කර ගත හැක.

4.5 යම් බැංකුවක් පෙර වර්ෂයේ අලාභයක් උපයා ඇති විටක පමනක් ක්ෂේත්‍රගත නිලධාරින් ද නිර්නායක/කොන්දේසි සම්පූර්ණ කර තිබුනද, මාසික දීමනාව ලබාදීම නොකලයුතුය. එවැනි අවස්ථාවක, බැංකුවට දීමනා ලබා ගැනීමට අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) විසින් විශේෂ අනුමැතිය දී ඇති විටක, එය පාදක කරගෙන ග්‍රාම නිළධාරි වසම් වල නිළධාරින්ටද දිමනාව ගත හැක.

**4.6 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක පහත නිලධාරින්ට මාසික දීමනාව ලබා ගැනීමට සම්පූර්ණ කළ යුතු නිර්ණායක/ සුදුසුකම්.**

මෙම නිලධාරින්ටද, මෙම දීමනාව ලබා ගැනීමට නම්, බැංකු සමිතිය අදාල නිර්ණායක/ සුදුසුකම් සම්පූර්ණ කර දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය.
පහත එක් එක් නිලධාරියා විසින්, සම්පූර්ණ කළ යුතු නිර්ණායක/සුදුසුකම් සියල්ලම(100%) සම්පූර්ණ වීම අත්‍යවශ්‍ය වේ.

**(I)** **ව්‍යාපෘති කළමණාකරු**

1.මාසය තුළ සමෘද්ධි බැංකු/ බැංකු සමිතියට ලද ණය ඉල්ලුම් වලට අදාළ ණය ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, සහාය වීම, ඇගයීම් කිරීම, නිර්දේශ ලබාදීම වැනි කටයුතු සියල්ල නිම කර තිබීම.
2. සමෘද්ධි ඉසුරු හා නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය වැඩසටහන් යටතේ ක්‍රියාත්මක ආදායම් උත්පාදන ව්‍යාපෘති පෙර සහ පසු විපරම් සිදු කිරීම හා වාර්තා කිරීම.
3. සමෘද්ධි බැංකු ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ක්‍රියාත්මක ණය හා දෙපාර්තමේන්තුවෙහි අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීමට සහාය දක්වා තිබීම.
4. අස්වැසුම පවුල් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් පිළිබඳව පසුවිපරම් කිරීම/සහාය සේවා ලබාදීම වැනි කටයුතු සිදු කිරීම.

**(II)** **ව්‍යාපෘති සහකාර**

1 මාසය තුළ සමෘද්ධි බැංකු/ බැංකු සමිතියට ලද ණය ඉල්ලුම් වලට අදාළ ණය ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, සහාය වීම, ඇගයීම් කිරීම, නිර්දේශ ලබාදීම වැනි කටයුතු සියල්ල නිම කර තිබීම.
2 සමෘද්ධි ඉසුරු හා නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය වැඩසටහන් යටතේ ක්‍රියාත්මක ආදායම් උත්පාදන ව්‍යාපෘති පෙර සහ පසු විපරම් කිරීම සිදු කිරීම හා වාර්තා කිරීම.
3. සමෘද්ධි බැංකු ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ක්‍රියාත්මක ණය හා දෙපාර්තමේන්තුවෙහි අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීමට සහාය දක්වා තිබීම.
4. අස්වැසුම පවුල් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් පිළිබඳ පසුවිපරම් කිරීම /සහාය සේවා ලබාදීම වැනි කටයුතු සිදු කිරීම.

**(IV)** **සමාජ සංවර්ධන නිලධාරින්**

1. අවම වශයෙන් මාසයකට මත් නිවාරණ වැඩසටහන් 02 බැගින් ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් පවත්වා තිබිම හා වාර්තා කිරිම.
2. කැකුළු ළමා සමාජයන්හි ක්‍රියාකාරකම් සොයා බැලීමට අවම වශයෙන් ළමා සමාජ රැස්වීම් 02වත් සහභාගී වීම.
3. ආගමික/සංස්කෘතික වැඩසටහන් ප්‍රාදේශිය/ ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් මාසිකව පැවැත්වීම හා ඒ සඳහා සහාය දක්වා තිබිම.
4. ගෘහ කළමණාකරණ වැඩසටහන් මාසිකව අවම වශයෙන් 02 ක් පැවැත්වීම.
5. පාසල් යන වයසේ පාසල් නොයන දරුවන් පිළිබඳව සොයාබලා ඔවුන් පාසල් ගතකිරීම හා ඒ පිළිබඳ මාසික වාර්තා ලබාදීම.

**4.7** සුදුසුකම් සපුරාලීමට නොහැකි වී, යම් මාසයක/මාස වලට දීමනා ලබාගැනීමට නොහැකි වී, ඉදිරි මාසයක සුදුසුකම් සපුරන විටක පසුගිය මාසවල දීමනාව ලබා ගැනීමට ඉඩදෙනු නොලැබේ.

**4.8** මාසික දීමනාව ට අදාල නිර්ණායක /කොන්දේසි සම්පූර්ණ කර ඇති බවට තහවුරුව කර ලබාදීම පහත නිලධාරින් විසින් කල යුතුය.

| විස්තරය | සහතිකය ලබාදිමට භාවිතා කලයුතු ආකෘතිය | තහවුරුව ලබාගත යුතු දිනය | තහවුරුව ලබාදෙන නිලධාරියා |
|---|---|---|---|
| සමෘද්ධි බැංකුව | ඇමුණුම -01 | එළඹෙන මාසයේ 20 දිනට පෙර | බැංකු සමිති කළමණාකරු |
| සමෘද්ධි බැංකු සමිතිය | ඇමුණුම -02 | එළඹෙන මාසයේ 20 දිනට පෙර | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ |
| කලාප සහකාර (ක්ෂේත්‍ර) | ඇමුණුම -04 | එළඹෙන මාසයේ 10 දිනට පෙර | බැංකු කළමණාකරු |
| ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරින් | ඇමුණුම -03 | එළඹෙන මාසයේ 15 දිනට පෙර | බැංකු කළමණාකරු |
| ව්‍යාපෘති කළමණාකරු | ඇමුණුම -04 | එළඹෙන මාසයේ 10 දිනට පෙර | බැංකු සමිති කළමණාකරු |
| ව්‍යාපෘති සහකාර | ඇමුණුම -04 | එළඹෙන මාසයේ 10 දිනට පෙර | බැංකු සමිති කළමණාකරු |
| සමාජ සංවර්ධන සහකාර | ඇමුණුම -04 | එළඹෙන මාසයේ 10 දිනට පෙර | බැංකු සමිති කළමණාකරු |

යම් සමෘද්ධි බැංකු කළමනාකරුවෙකු, බැංකු සමිතියක හෝ බැංකු සමිතියක කළමණාකරුවෙකු සමෘද්ධි බැංකුවක වැඩබලන විටක තහවුරුව මුලස්ථාන කළමනාකරුගෙන් ලබාගත යුතුවේ.

## 05. දීමනා ගෙවීමට අදාළ ගිණුම් සටහන

ලබාදෙන දීමනාව නිලධාරින්ගේ පුද්ගලික සාමාජික නොවන /දිරියමාතා/ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුමක් හරහා ලබාදීම කළ යුතුය. ඒ සඳහා ගිණුම් සටහන පහත වේ.

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකුව</u>

වැය ගිණුම - කාර්යය මණ්ඩල දීමනා හා ගමන් වියදම් ගිණුම - හර (කේත අංක 2113)
දිරිය මාතා/සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුම - බැර

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය</u>

වැය ගිණුම - කාර්යය මණ්ඩල දීමනා හා ගමන් වියදම් ගිණුම - හර (කේත අංක 6203)
ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුම - බැර

## 06. සති අන්ත දිනවල රාජකාරි වල නිරත වීම හා දිනවැටුප් ලබා ගැනීම.

6.1 සමෘද්ධි බැංකුවකට මාසයකට උපරිම සති අන්ත දින 03 ක් රාජකාරි කල හැක. දින වැටුප්, සමෘද්ධි බැංකු අරමුදලින් ලබා ගත යුතුය. සති අන්ත දින වල ඉටුකල යුතු රාජකාරි පහත වේ.

i. ප්‍රගති වාර්තා සකස් කිරීම හා සමාලෝචනය - පළමු සෙනසුරාදා

ii. <u>අනිකුත් සති අන්ත දිනවල,</u>

*ඉතුරුම් ප්‍රවර්ධනයට අදාල වැඩසටහන් හදුනාගැනීම, සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මකකිරීම.
* අක්‍රිය ගිණුම් හිමියන් හා කොටස් මුදල සම්පූර්ණ නොකරන ලද පුද්ගලයින් හඳුනාගෙන, සක්‍රීය කොටස්කරුවන්/ ගිණුම් හිමියන් බවට පත් කිරීමට අදාල කටයුතු කිරීම
* අස්වැසුම සවිබල ගැන්වීම් වැඩසටහන යටතේ සවිබලගැන්විම සඳහා හඳුනාගත් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛන ගොනු සකස් කිරීම ,ආදායම් උත්පාදන ව්‍යාපෘති හඳුනා ගැනීම, ණය ප්‍රදානයට සුදුසුකම් සම්පූර්ණ කිරීම.
* සවිබලගැන්වීම් වැඩසටහන යටතේ මානසික හා සමාජීය සවිබලගැන්වීම් ක්ෂේත්‍රයන්ට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
* බොල් ණය/කල්පසුවූ ණය ආපසු අයකර ගැනීමට අදාල රාජකාරි.
* සමෘද්ධි බැංකු ණය මුදාහැරීම් වලට ආදාල ගොනු සකස් කිරීම හා ඉදිරි සැලසුම් සම්බන්ධ රාජකාරි වල නිරතවිම.
* ඉදිරි මාසයේ/කාර්තු වල ණය ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේ රාජකාරි.
* සමෘද්ධි බැංකු ප්‍රගති රැස්වීම්,බැංකු සමිති ප්‍රගති රැස්වීම්, පාලක මණ්ඩල රැස්වීම් වලට අදාළ වාර්තා හා ගොනු පිළියෙල කිරීමේ රාජකාරි වල නිරත වීම.
* බැංකු පරිශ්‍රයේ අභ්‍යන්තර/බාහිර ආරක්ෂාව හා පිරිසිදු කිරීම් රාජකාරි.
*මෘදුකාංගය මඟින් ඉතුරුම් තැන්පතු පොළී බැර කිරීම්, පරිගණක මෘදුකාංගයට අදාලව පැවරෙන විශේෂ රාජකාරි සිදුකිරීම.(සති අන්ත/රජයේ නිවාඩු වලට යෙදෙන අවස්ථාවලදී)

6.2.ගමන් වියදම්, අතට පාඩු/අතිකාල හා යතුරු ධාරක දීමනාවන් සම්බන්ධව දැනට ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙසත්, ඒ සඳහා **ප්‍රජාමූල බැංකු/බැංකු සමිති සඳහා මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීමේ චක්‍රලේඛයේ** උපදෙස් පිළිපැදිය යුතුය.එමෙන්ම රාජකාරි සඳහා පැමිණීමට පූර්ව අනුමැතිය දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙතින් ලබාගත යුතුය.

සී.ඩී.කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.හා අ.ක.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස.හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස.හා අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය - අ.ක.ස.

## මාසික දීමනාව ලබාගැනීම සඳහා සම්පූර්ණ කලයුතු නිර්ණායක/සුදුසුකම් සහතික කිරීම

සමෘද්ධි බැංකුව: වර්ෂය/ මාසය:

| නිර්ණායක/සුදුසුකම් | තිබිය යුතු තත්ත්වය/සම්මත අගය | පවතින/අත්කර ගෙන ඇති ප්‍රගතිය | සුදුසුකම/නිර්ණායකය සම්පූර්ණ කර ඇත/නැත |
|---|---|---|---|
| i. ආසන්න (පසුගිය වර්ෂය) පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් ලාභයක් උපයා තිබීම. | ලාභ උපයා ගෙන ඇත/විශේෂ අනුමැතිය ලබා ගෙන | | |
| ii. ඉතුරුම් තැන්පතු මුදලෙහි වර්ධනය | ......... | | |
| iiiණය තැන්පතු අනුපාතය (අනිවාර්ය ඉතිරි තැන්පතු හැර) | 60% ක් හෝ ඊට වැඩි විය යුතුය | | |
| iii.බොල්ණය අනුපාතය | 7% | | |
| iv.කල්පසුවූ ණය අනුපාතය | 10% | | |
| Vප්‍රගති.වාර්තා හා ශේෂ පරික්ෂණ ලබාදිම<br>▪ ණය<br>▪ තැන්පතු<br>▪ අයෝජන<br>▪ ශේෂ පරික්ෂණය (තුලනය වූ) | මාසයේ 5දිනට පෙර | | |
| vi.මාසය තුල ලද, අභ්‍යන්තර/භාහිර විගණන විමසුම් සඳහා පිළිගත හැකි පිළිතුරු ලබාදී තිබීම. | විමසුම ලැබි දින 14 තුල | | |

නිර්ණායක /සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පරික්ෂා කර සහතික කිරීමට ඉදිරිපත් කරමි.

<u>කළමනාකරු</u>

නම :

අත්සන :

දිනය :

20…….……. මාසයට අදාලව තොරතුරු හා වාර්තා පරික්ෂා කර නිර්ණායක/සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත, දිමනාව ලබාගැනිම සහතික කරමි/නොකරමි

<u>බැංකු සමිති කළමනාකරු</u>

නම :

අත්සන :

දිනය :

ඇමුණුම **-02**

## මාසික දීමනාව ලබාගැනීම සඳහා සම්පූර්ණ කලයුතු නිර්ණායක/සුදුසුකම් සහතික කිරීම

සමෘද්ධි බැංකු සමිතිය : වර්ෂය/ මාසය:

| නිර්ණායක/සුදුසුකම් | තිබිය යුතු තත්ත්වය/සම්මත අගය | පවතින/අත්කර ගෙන ඇති ප්‍රගතිය | සුදුසුකම/නිර්ණායක සම්පූර්ණ කර ඇත/නැත |
|---|---|---|---|
| i. ආසන්න (පසුගිය වර්ෂය) පෙර වර්ෂයේ මෙහෙයුම් ලාභයක් උපයා තිබීම. | ලාභ උපයා ගෙන ඇත/විශේෂ අනුමැතිය ලබා ගෙන | | |
| iii.බොල්ණය අනුපාතය | 5% | | |
| iv.කල්පසුවූ ණය අනුපාතය | 7% | | |
| V සමෘද්ධි බැංකු ප්‍රගති.වාර්තා හා ශේෂ පරික්ෂණ ලබාදීම<br>▪ ණය<br>▪ තැන්පතු<br>▪ ආයෝජන<br>▪ ශේෂ පරික්ෂණය (තුලනය වූ) | මාසයේ10දිනටපෙර | | |
| vi. සමෘද්ධි බැංකු සමිති ප්‍රගති.වාර්තා හා ශේෂ පරික්ෂණ ලබාදීම<br>▪ ණය<br>▪ තැන්පතු<br>▪ ආයෝජන<br>▪ ශේෂ පරික්ෂණය (තුලනය වූ) | මාසයේ10දිනටපෙර | | |
| vii.මාසය තුල ලද, අභ්‍යන්තර/භාහිර විගණන විමසුම් සඳහා පිළිගත හැකි පිළිතුරු ලබාදී තිබීම. | විමසුම ලැබි දින 14 තුල | | |
| viii. සමෘද්ධි බැංකු ආයෝජනය අරමුදල් ආයෝජනය කර තිබීම. | දින 03ක් ඇතුළත | | |
| ix.කල්පිරුණු ආයෝජන, බැංකුවේ ඉල්ලීම අනුව කටයුතු කර තිබීම හා පොළි නිවේදන බැංකුව වෙත යොමුකර තිබීම | දින 05 ක් ඇතුළත | | |

නිර්ණායක /සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පරික්ෂා කර සහතික කිරීමට ඉදිරිපත් කරමි.

<u>බැංකු සමිති කළමනාකරු</u>

නම :

අත්සන :

දිනය :

20……..…….. මාසයට අදාලව තොරතුරු හා වාර්තා පරික්ෂා කර නිර්ණායක/සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත,දීමනාව ලබාගැනීම සහතික කරමි/නොකරමි

<u>දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ</u>

අත්සන :

දිනය :

(නිල මුද්‍රාව)

**මාසික දීමනාව ලබාගැනීම සදහා සම්පූර්ණ කලයුතු නිර්ණායක/සුදුසුකම් සහතික කිරීම**

ග්‍රාම නිලධාරි වසම: නිළධාරියාගේ නම: වර්ෂය/ මාසය:

| නිර්ණායක/සුදුසුකම් | තිබිය යුතු තත්ත්වය/සම්මත අගය | පවතින/අත්කර ගෙන ඇති ප්‍රගතිය | සුදුසුකම/නිර්ණායකය සම්පූර්ණ කර ඇත/නැත |
|---|---|---|---|
| i. ණය තැන්පතු අනුපාතය. | 60% හෝ ඊට වැඩි විය යුතුය | | |
| ii. බොල්ණය අනුපාතය | 7% | | |
| iii. කල්පසු වූ ණය අනුපාතය | 10% | | |
| iv. තැන්පතු මුදලෙහි වර්ධනය | ….. | | |

නිර්ණායක /සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පරික්ෂා කර සහතික කිරීමට ඉදිරිපත් කරමි.

සමෘද්ධි සංවර්ධන නිළධාරි

නම :

අත්සන :

දිනය :

20……..……. මාසයට අදාලව තොරතුරු හා වාර්තා පරික්ෂා කර නිර්ණායක/සුදුසුකම් සම්පූර්ණ කර ඇති/නැති (බවට) දීමනාව ලබාගැනීම සහතික කරමි/නොකරමි.

බැංකු කළමනාකරු

නම :

අත්සන :

දිනය :

**මාසික දීමනාව ලබාගැනිම සදහා සම්පූර්ණ කලයුතු නිර්ණායක/සුදුසුකම් සහතික කිරීම**

තනතුර: වර්ෂය/ මාසය:

| නිර්ණායක/සුදුසුකම් (අදාල නිලධාරින් විසින් සම්පූර්ණ කළ යුතු නිර්ණායක/සුදුසුකම්) | තිබිය යුතු තත්ත්වය/සම්මත අගය | පවතින/අත්කර ගෙන ඇති ප්‍රගතිය | සුදුසුකම/නිර්ණායකය සම්පූර්ණ කර ඇත/නැත |
|---|---|---|---|
| | | | |

නිර්ණායක /සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පරික්ෂා කර සහතික කිරීමට ඉදිරිපත් කරමි.

<u>ව්‍යාපෘති කළමනාකරු/</u> <u>ව්‍යාපෘති සහකාර/සමාජ සංවර්ධන නිළධාරි/</u> <u>කලාප සහකාර (ක්ෂේත්‍ර)</u>

නම :

අත්සන :

දිනය :

20……..……. මාසයට අදාලව තොරතුරු හා වාර්තා පරික්ෂා කර ,නිර්ණායක/සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත, දීමනාව ලබාගැනිම සහතික කරමි/නොකරමි

<u>සමෘද්ධි බැංකු/බැංකු සමිති කළමනාකරු</u>

නම :

අත්සන :

දිනය :